සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

## පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

**II පත්‍රය**

**නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන**

# "අදිති"

| 14 |
|---|

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 65 ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | <br>V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | <br>V/I/S/CH |

**1. පහත ඡේදය හොඳින් කියවන්න.**

ඔල්සන්ට සුරතල් සතකු අවශ්‍ය වූයේ ඇයි ද යන්න හෝ ඒ සතා ගෙනාවේ ඇයි ද යන්න මගෙන් අහන්න එපා. මානසික විද්‍යාඥයකු නොවන නිසා මට ඊට පිළිතුරු දිය නොහැකියි. එහෙත් ඔහුගේ තේරීම ඉතා ඥානාන්විත බව කිව යුතුයි. ක්ලැරිබෙල්ගේ බර ඉතා සුළු ප්‍රමාණයක් වූවා පමණක් නොව උෟට අවශ්‍ය වූයේ සුළු ආහාර ප්‍රමාණයක්. අනෙක් අතට වෙනත් සතුන් මෙන් ගුරුත්වය රහිත වීමේ තත්ත්වය නිසා ඈ බිය වූයේ නැහැ.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. සුරතල් සතෙකු අවශ්‍ය වූ කෙනා කවු ද?

..............................................................................................................................

ii. ඡේදයේ සඳහන් පරිදි "මට ඊට පිළිතුරු දිය නොහැක්කේ" ඇයි ?

..............................................................................................................................

iii. උෟට අවශ්‍ය වූ ආහාර ප්‍රමාණය පිළිබඳ මෙහි සඳහන්ව ඇත්තේ කෙසේ ද?

..............................................................................................................................

iv. ඡේදයේ සඳහන් ස්ත්‍රී ලිංග සත්ත්ව නාම පදය කුමක් ද?

..............................................................................................................................

v. "සහිත"යන්නට අර්ථයෙන් විරුද්ධ පදයක් ඡේදයේ සඳහන් වී ඇත. එම පදය කුමක්ද?

..............................................................................................................................

vi. දික්කොන් පාපිල්ල සහිත වචනයක් සොයා ලියන්න.

..............................................................................................................................

**2. පහත සදහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

i. අයියා උදෑසන ම පාසලට යයි. ( )
ii. සමනල්ලු මල්පැණි සොයා යති. ( )
iii. ගුරුතුමිය ළමයින්ගේ දක්ෂතා අගය කළා ය. ( )
iv. ගුවන්යානා අහසේ කරණම් ගැසූහ. ( )

**3. බහු වචන අතීත කාල ක්‍රියාපදය යටින් ඉරක් අඳින්න.**

පීනති , නටයි , ගියෙමු

**4. දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.**

i. යන / වේදිකාවට / බදුල්ල / පැමිණියේ ය / බලා / දුම්රිය

..............................................................................................................................

**5. කොටුව තුළ දී ඇති වචනවලින් නිවැරදි අක්ෂර** වින්‍යාසය **සහිත වචන දෙක තෝරා හිස්තැන් මත ලියන්න.**

| | |
|---|---|
| කැළණි | හුණු පුවරුව |
| නිළධාරියා | පිළිවෙළ |
| දළු | විශිෂ්ඨ |

i. ................................................
ii. ................................................

**6. මෙම වැකිය ලේඛන වහරට හරවා ලියන්න.**

i. ශිෂ්‍යාවෝ රංගනයට සූදානම් වුණා.

..............................................................................................................................................

**7. "ලස්සන" යන්නට විරුද්ධ පදයක් ලියන්න.**

..............................................................................................................................................

**8. යුගල පදය සම්පූර්ණ කරන්න.**

අස්සක් - ......................................

**9. පහත සඳහන් අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.**

එක තීරණයක නොසිටීම.

.................................................................................................................

**10. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

i. අද පුස්තකාල පන්තියක් කරමු ළමයි එක හඬින් කීහ

ii. ඇයගේ කැපවීම පුදුමාකාර ය

**11. පහත සඳහන් කවියේ ඇති හිස්තැන සම්පූර්ණ කරන්න.**

පලා පැහැය හැම කල්හි ම
රැඳී දිලෙන පොළොවේ
ඉවත දමන දඬුව වුව ද


.............................................

**12. විරුද්ධාර්ථ පද දෙක තෝරා ලියන්න.**

| |
|---|
| ගස , ඉර , හිරු , වැරදි |
| නොදිරන , චූටි , නිවැරදි |

i. ...................... , .......................

**13. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

i.  ........................................

ii.  ........................................

**14. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.**

i. playground / go / Let's / the / to

......................................................................................

ii. don't / ice cream / I / like

......................................................................................

**15. ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.**

i. Tree ....................................

**16. එක් එක් රූපයට ගැළපෙන දෙමළ වචනය සිංහල අකුරෙන් ලියන්න.**





.............................................. ..............................................

**17. පහත සඳහන් වැකියේ සිංහල අර්ථය සිංහලෙන් ලියන්න.**

i. එනක්කු ඔරු තම්බි ඉරුක්කිරාර්.


..........................................................................................................................

**18. මෙම වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.**

i. මේ අපේ පාසල

..........................................................................................................................

**19. රවුම තුළ ඇති ඉලක්කම් හතර ම යොදාගෙන සෑදිය හැකි කුඩා ම සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.**




......................................

**20. දී ඇති සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.**

5368 , 4099 , 2990 , 4201 , .................... , ....................... , ................... , ....................

**21.** තරණි ළඟ තිබූ පොත් 500 කින් 80 ක් හැර ඉතිරිය පාසල් 4 ක් අතර සමාන ව බෙදා දුන්නා ය . එක් පාසලකට ලැබුණු පොත් ගණන කීය ද?


..................................................................................

22. 4m 5cm දිග ලණුවකින් 1m 8cmක කොටසක් කපා ඉවත් කළේ නම් ඉතුරු කොටස කොපමණ දිග ද?

.........................................................

23. දුම්රියක පිරිමි මගීන් 1065 ක් ද ගැහැනු මගීන් පිරිමි මගීන්ට වඩා 870 ක් වැඩියෙන් ද සිටිති. දුම්රියේ සිටින මුළු මගීන් ගණන කීය ද? ..............................................


24. පහතින් දක්වා ඇති පැන්සලෙහි දිග කොපමණ ද? ..............................................



25. එක්තරා වර්ෂයක ජනවාරි මාසයේ 1 වෙනිදා සෙනසුරාදා දවසකි. එම මාසයේ දින පහ බැගින් ඇති දවස් මොනවා ද? ................................................

26. 500ml ක ධාරිතාවයකින් යුත් මෙම භාජනයේ කොටසක් ජලයෙන් පුරවා ඇත. එම භාජනය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජලය අවශ්‍ය ද?

............................




27. පහත සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස්තැන සම්පූර්ණ කරන්න


5 , 10 , 7 , 13 , 9 , 16 , 11, 19 , ...........

28. සස්මිත ළග තිබූ රු. 612.00 ක මුදලින් $\frac{1}{4}$ ක් වියදම් කොට පොතක් මිලට ගත්තේ නම්. ඔහුට ඉතුරු වූ මුදල කිය ද? ........................

29. කොළඹ වරායේ දර්ශනයක් සහිත මුදල් නෝට්ටුව කුමක් ද?
........................................................................

30. 3kg 250g ක් බරැති වට්ටක්කා ගෙඩියක බර කිරා ගැනීමට මුදලාලි අවම තරාදි පඩි ගණනක් යොදා ගත්තේ ය. එම තරාදි පඩි බර අඩුවන අනුපිළිවෙළින් ලියා දක්වන්න.

.....................................................

31. 

මෙම කුරුලු රූපේ සිටින කුරුල්ලන් ගණන රෝම සංඛ්‍යාවෙන් ලියන්න.

...............................................

- මෙම මිල දර්ශනය අනුව ප්‍රශ්න 32, 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල |
|---|---|---|
| සහල් | 1 kg | රු. 98.00 |
| පොල්තෙල් | 1l | රු. 216.00 |
| සීනි | 1kg | රු. 156.00 |

32. සහල් 500g ක් හා සීනි 1kg ක් මිලට ගැනීමට ගෙවිය යුතු මුදල කීය ද? .............................

33. පොල්තෙල් 250ml ක මිල කීය ද? .....................................................

- ප්‍රශ්න අංක 34 සිට 64 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.

34. අඩුවෙන් වතුර පානය කිරීම නිසා අපට දැනෙන අපහසුතාවයකි.

(1) සිරුරේ මලානික ගතිය (2) සමෙහි පැහැපත් බව ආරක්ෂා වීම.
(3) මුත්‍රා කිරීමේ පහසුව

35. "සියලු දෙයින් ම ජය ලබන්න මට පුළුවන්" මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකම්වල කුමන ක්‍රියාකාරකමට අයත් වේ ද?

(1) අධිෂ්ඨානය (2) ප්‍රාර්ථනාව (3) උදානය

36. "පාට සුවඳ එක වගේ
තිබෙන රෝස මල වගේ
කීකරු පොඩි ළමයගේ
කවුරුත් පවසති අගේ " යන කවිය ඇතුළත් " හොඳ ළමයා " කවි පන්තිය රචනා කරනු ලැබුවේ.

(1) රණස්ගල්ලේ හිමි (2) එස්. මහින්ද හිමි (3) විදාගම මෛත්‍රී හිමි

37. ශ්‍රී ලංකාවට ඔලිම්පික් පදක්කම් දිනා දුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වන්නේ,
(1) සුසන්තිකා ජයසිංහ , ඩිලන්ත මාලගමුව
(2) දමයන්ති දර්ශා , ලසිත් මාලිංග
(3) ඩන්කන් වයිට් , සුසන්තිකා ජයසිංහ

38. ශ්‍රී ලාංකිකයින්ට උරුම වූ පැරණි සටන් ශිල්ප ක්‍රමයකි.
(1) කිරි කොරහා නැටිම (2) අංගම් පොර (3) දහ අට සන්නිය

39. ශ්‍රී ලංකාවට අභිමානයක් එක්කළ ලෝක උරුමයක් ලෙස සැලකෙන්නකි.
(1) දළදා මාලිගය (2) අවුකන පිළිමය (3) පරාක්‍රම සමුද්‍රය

40. 1848 නිදහස් සටන සංවිධානය කර පොදු ජනතාව මගින් පණ පොවා නායකත්වය දුන් ජාතික වීරවරයා වන්නේ,
(1) මොනරවිල කැප්පෙටිපොළ දිසාව
(2) ගොංගාලේගොඩ බණ්ඩා
(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු

41. රාජ්‍ය ලාංඡනයේ කඩුවක් අතින් ගත් පලාපෙති වටය මැද සිටින සිංහයාගෙන් නිරූපණය වන්නේ,
(1) සිංහල ජාතියයි. (2) රට හා විනය ගරුක ජනයා ය.
(3) ජාතික අභිමානය යි.

42. උප්පැන්න / මරණ සහතික ලියා පදිංචිය සිදු කරනු ලබන ආයතනය වන්නේ,
(1) ග්‍රාම නිලධාරි කාර්යාලය (2) ප්‍රාදේශිය ලේකම් කාර්යාලය
(3) ප්‍රාදේශිය සභාව


43. මුල් මගින් ශාකයට සැලසෙන ප්‍රයෝජනයක් වන්නේ,
(1) බීජ ව්‍යාප්තියට සහය වීම.
(2) පරපෝෂිත සතුන් විනාශ කිරීම
(3) ජලය හා පොහොර උරා ගැනීම.

44. පත්‍ර තලය මැද නටුව පිහිටා ඇති ශාක පත්‍රයකි.
(1) කැන්ද (2) කරපිංචා (3) බෝ

45. ඖෂධයක් ලෙස බහුල ව මුල් භාවිතයට ගන්නා ශාකයකි.,
(1) රණවරා (2) පොල් (3) සැවැන්දරා

46. ශ්‍රී ලංකාවට ආවේණික දම්පැහැති මල් හටගන්නා ඖෂධීය ගුණයෙන් පිරි ශාකයකි.
(1) හීං බෝවිටියා (2) කොහොඹ (3) නුග

47. මෙම මල් බොහෝ විට පිපෙන මාසය වන්නේ,



(1) ජූලි (2) අප්‍රේල් (3) මැයි

48. පෘෂ්ඨයකට ඇලී සිටීම සඳහා විශේෂ පාද පිහිටා ඇති සතෙකි.
(1) පූසා (2) හූනා (3) කැරපොත්තා

49. සතුන් මගින් මිනිසාට සැලසෙන සේවාවකි.

(1) මානසික සුවය හා විනෝදාස්වාදය ලබා දීම.
(2) පිරිසිදු පානීය ජලය ලබා දීම
(3) නිසිකලට එන්නත් කිරිම හා සෞඛ්‍ය පහසුකම් සැපයීම.

50. ශාක කොටස් හා සත්ත්ව මාංශ ආහාරයට ගන්නා සතෙකි.

(1) වලිකුකුළා (2) ගිරවා (3) හාවා

51. ශ්‍රී ලංකාවට ආවේණික උරග විශේෂයන් දෙකක් අඩංගු පිළිතුර වන්නේ,

(1) වලි කුකුළා = හබන් කුකුළා
(2) යක්කටුස්සා = දියනයා
(3) බුලත් හපයා = මල් පුලුට්ටා

52. පිළිවෙළ හා පිරිසිදුකම ජීවිතයට එක්කර ගත්විට

(1) ප්‍රසන්න හැඟීමෙන් කටයුතු කළ හැකි ය.
(2) සිත් තැවුල් හා අතපසු වීම් වැඩි වේ.
(3) අන් අයගේ ගැරහුමට ලක් වේ.

53. පාසල් යන සිසුන් යහපත් සෞඛ්‍යයක් පවත්වා ගැනීම සඳහා දිනකට කොපමණ ජල ප්‍රමාණයක් පානය කළ යුතු ද?

(1) ජලය ලීටර් 12 පමණ.
(2) ජලය ලීටර $1\frac{1}{2} - 2$ දක්වා ප්‍රමාණය.
(3) ජලය ලීටර 8 ක් පමණ.

54. විටමින් D බහුල ආහාර වර්ග අඩංගු පිළිතුර වන්නේ.

(1) මාළුතෙල් , බිත්තර , කිරි
(2) දොඩම් , කැරට් , අන්නාසි
(3) රටකජු , තල , පොල්

55. විටමින් A පෝෂ්‍ය පදාර්ථය අවශ්‍ය ප්‍රමාණයට ශරිරයට නොලැබුණහොත් ඇතිවිය හැකි තත්ත්වයකි,


(1) කට කොන් වන වීම.
(2) අස්ථි ආශ්‍රිත රෝග ඇති වීම.
(3) ඇස් පෙනීම දුර්වල වීම.

56. ලුණු දමා කල් තබා ගන්නා ආහාර වන්නේ,

(1) මස් , රටඉඳි (2) කෙසෙල් , බිලිං (3) දෙහි , මාළු

57. අයිස් කැට ප්‍රායෝගිකව ප්‍රයෝජනයට යොදාගන්නා අවස්ථාවක් වන්නේ,

(1) මාළු නරක් නොවී තබා ගැනීමට.
(2) සායම් වර්ග දිය කිරීමට.
(3) පොල් කිරි ඉක්මනින් මිරිකා ගැනීමට.

58. 

මෙහි අඳුරු කර ඇති පළාතට අයත් දිස්ත්‍රික්කයක් වන්නේ,

(1) මහනුවර (2) බදුල්ල (3) මඩකලපුව

59. කෙනෙකුගෙන් තවත් කෙනෙකුට බෝනොවන රෝගයකි,

(1) පැපොල , සරම්ප වැනි රෝග (2) අධි රුධිර පීඩනය
(3) කොරෝනා වැනි වෛරස් රෝග

60. ජල වාෂ්ප යොදා ගනිමින් පිළියෙල කර ගන්නා ආහාරයකි.

(1) ආප්ප (2) රොටී (3) වණ්ඩු

61. සාමාන්‍ය පාපැදියක ඉදිරිපස දැති රෝදය එක් වටයක් කරකැවෙන විට පිටුපස නිදහස් දැති රෝදය,
(1) එක් වටයක් කරකැවේ.
(2) වට බාගයක් කරකැවේ
(3) එක් වටයකට වඩා කරකැවේ

62. 
මෙම මාර්ග සංඥාව දැකිය හැකි ස්ථානයක් වනුයේ,
(1) පන්සලක් ඉදිරියේ (2) බැංකුවක් ඉදිරියේ
(3) උසාවියක් ඉදිරියේ

63. පාර මාරු වීමේ දී පදිකයෙකු මුලින් ම බැලිය යුත්තේ,
(1) වම් පස (2) දකුණු පස (3) ඉදිරි පස

64. බෝග වගාවට හිතකර සත්ත්ව කාණ්ඩය වන්නේ,
(1) සමනලයා , ගොළුබෙල්ලා , කුකුළා (2) මී මැස්සා , ගැඩවිලා , බකමූණා
(3) මොනරා , කටුස්සා , ඇටිකුකුළා

65. සතුන්ට ආදරය දක්වන දම්සිත් කුරුල්ලන්ට කෑම දීමේ ආසාවෙන් කුරුලු ලෑල්ලක් සෑදුවේ ය. කුරුලු ලෑල්ලේ සතුන් කෑම කන අයුරු දකින දම්සිත් පසෙකට වී බලා සිටියි.

**පහත රූප රාමු ඇසුරු කරගනිමින් වාක්‍ය තුනක් ලියන්න.**

(සෑම වාක්‍යයක් ම වචන පහකට නො අඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)



01. ..........................................................................................................................

..........................................................................................................................

02. ..........................................................................................................................

..........................................................................................................................

03. ..........................................................................................................................

..........................................................................................................................